# වී වගාවට කොළ පොහොරක් ලෙස දිය සියඹලා වර්ගයක් (සෙස්බේනියා රොස්ට්‍රාටා) යෙදිය හැකිය

ගිරාදුරුකෝට්ටේ කෘෂිකර්ම පර්යේෂණායතනයේ ස්ථානභාර පර්යේෂණ නිළධාරී
**කේ.එම්.සී. බණ්ඩාර** විසිනි.



සෙස්බේනියා රොස්ට්‍රාටා පැළයේ කඳ
මතුපිට මුල ගැටිති හට ගැනීම

රසායනික පොහොර මිල දිනෙන් දින ඉහළ යමින් පවතී. මේ හේතුවෙන් වී වගා කරන ගොවීන්ට රසායනික පොහොර මිලට ගැනීම සඳහා විශාල වියදමක් දැරීමට සිදුවී ඇත. පොහොර සඳහා වියදම් වන මේ සා විශාල මුදල යම් ප්‍රමාණයකින් හෝ අඩුකර ගැනීම සඳහා කාබනික පොහොර භාවිතය හොඳම පිළියමයි. පෙරකල පටන් මෙරට ගොවීහු සී සෑමේ කටයුතු වලට පෙර ග්ලිරිසීඩියා, කරඳ, මී ආදී ගස්වල අතු ද, බඩවැටි හා වනාත් කප්පාදුවෙන් ලබාගන්නා විවිධ අතු වර්ග ද, කුඹුරු පස සරුකර ගැනීම සඳහා යෙදීමට පුරුදුවී සිටියෝය. කාබනික පොහොර යෙදීමේදී ඒවා සොයා ගැනීමට ඇති අපහසුවත්, විශාල ප්‍රමාණයක් කෙෂ්ත්‍රයට යෙදිය යුතුවීමත්, බාධක ලෙස පවතී. මීට පිළියමක් වශයෙන් බොහෝ ආසියාතික රටවල වායුගෝලීය නයිට්‍රජන් තිර කිරීමේ හැකියාව සහිත රනිල පැළෑටි, වී අස්වනු නෙළීමෙන් පසු කුඹුරුවල වගා කොට පසට යටකොට වී වගා කරනු ලැබේ. මෙම ක්‍රමය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමට ඇති හැකියාව සොයා බැලීම සඳහා පර්යේෂණ පැවැත්වුණි. ගිරාදුරුකෝට්ටේ කෘෂිකර්ම පර්යේෂණස්ථානයේ දී වර්ෂ ගණනාවක් තුළ පවත්වන ලද අත්හදා බැලීම් තුළින් මෙම ක්‍රමය ශ්‍රී ලංකාවේ විශේෂයෙන් වියළි හා අන්තර් කලාප වල සාර්ථකව පවත්වාගෙන යා හැකි බව සොයා ගෙන තිබේ.

සෙස්බේනියා රොස්ට්‍රාටා නම් පැළෑටිය රනිල කුලයට අයත් වන අතර, එම පැළෑටි සතු වූ, අනෙකුත් රනිල ශාක වලට වඩා විශේෂ වූ ලක්ෂණයක් වනුයේ වායු ගෝලීය නයිට්‍රජන් තිර කරන බැක්ටීරියා එම ශාකයේ කඳ මතුපිට වැඩී මුල ගැටිති වලට සමාන ගැටිති ඇති කිරීමයි. මෙම ශාක මල් පිපෙන අවධියේ දී පසට යට කිරීමෙන් ශාකය මගින් තිර කරන ලද නයිට්‍රජන් හා ශාකයේ අඩංගු අනෙකුත් පෝෂක වර්ග ගොයම් ගසට ලබාදිය හැකි වේ.

අනෙකුත් රනිල ශාක සමග සංසන්දනය කිරීමේදී මෙම පැළෑටිය තුළ දක්නට ලැබෙන තවත් විශේෂ ලක්ෂණයක් වනුයේ ජලය හොඳින් බැස යන පාංශු තත්ව යටතේ මුල ගැටිති ඉතා හොඳින් වර්ධනය වීමත්, ජලය බැස නොයන පාංශු තත්ව යටතේ මුල ගැටිති වැඩීමක් නොමැතිව කඳේ ඒ හා සමාන ගැටිති වර්ධනය වීමත් වේ. ඒ අනුව මෙම ශාක වර්ගයට ඕනෑම පාංශු තත්වයක් යටතේ නයිට්‍රජන් තිර කිරීමේ හැකියාව ඇති බව පෙනේ.

## සෙස්බේනියා රොස්ට්‍රාටා පැළෑටිය කුඹුරු පසට යට කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන

- කාබනික පොහොරක් නිසා නොකඩවා කුඹුරට යෙදීමෙන් පස ක්‍රමයෙන් සාරවත් වේ. පාංශු ව්‍යුහය දියුණු වේ.
- පස තුළ ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරීත්වය හා කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය වැඩිවීමෙන් ගොයමට යොදන රසායනික පොහොර අවශෝෂණය කර ගැනීමේ කාර්යක්ෂමතාවය වැඩි වේ.

- දිරාපත්වන පැළෑටිය මගින් පසට නයිට්‍රජන් පොහොර වැඩි ප්‍රමාණයකුත්, පොස්පරස් හා පොටෑසියම් සුළු ප්‍රමාණයකුත් රට අමතරව ආංශු මාත්‍ර මූල ද්‍රව්‍යත් ලැබේ. මේ නිසා ධාන්‍යවල ගුණාත්මය හා බර වැඩි වේ.
- ඕනෑම පාංශු තත්ත්වයකට හොඳින් ඔරොත්තු දෙන නිසා මෙම පැළෑටිය කුඹුරේ විවිධ ජලවහන තත්වයන් යටතේ වගා කර එකවර පසට යට කළ හැකිය.
- කුඹුර පුරන්ව පවතින කාලසීමාව තුළ වගා කිරීම නිසා මෙම පැළෑටිය මගින් පස ආවරණයවීම හේතුකොට ගෙන කල්යෑමේදී වල් පැළෑටි ගහනය අඩුවන බව සොයා ගෙන ඇත.

## සෙස්බේනියා රොස්ට්‍රාටා රනිල පැළෑටිය භාවිතයත් සමග යෙදිය යුතු රසායනික පොහොර ප්‍රමාණයන්:

සෙස්බේනියා රොස්ට්‍රාටා වගා කිරීමෙන් හෙක්ටයාරයකින් ලැබෙන කොළ පොහොර ප්‍රමාණයෙහි ආසන්න වශයෙන් හෙක්ටයාරයක් සඳහා නිර්දේශිත නයිට්‍රජන් ප්‍රමාණය වන කි.ග්‍රෑ.100 ක් (යූරියා කි.ග්‍රෑ. 200 ක්) හා සමාන නයිට්‍රජන් ප්‍රමාණයක් අඩංගු වුවත්, සේදී යෑම, ජලයේ දියවී යෑම, නිදහස් නයිට්‍රජන් බවට පත්වීම ආදී නොයෙකුත් ක්‍රම මගින් මෙම නයිට්‍රජන් වලින් කොටසක් පසින් ඉවත්වේ. එසේම ජීර්ණය වීමෙන් පසු උරා ගැනීමට ද තරමක කාලයක් ගතවේ. එම නිසා සෙස්බේනියා රොස්ට්‍රාටා වගා කරන ලද කුඹුරු වලට නිර්දේශිත රසායනික නයිට්‍රජන් පොහොර ප්‍රමාණයෙන් අඩක් පමණක් යෙදීම ප්‍රමාණවත් වේ. කුඹුරු වල සෙස්බේනියා වගා කරන්නේ නම් රසායනික පොහොර යෙදීමේදී පහත සඳහන් අයුරු කටයුතු කරන්න.

1. මූලික පොහොරට එක් කරන නයිට්‍රජන් ප්‍රමාණය සම්පූර්ණයෙන්ම කපා හරින්න.
2. නයිට්‍රජන් පොහොර අඩක් අඩු කිරීමෙන් පසු හෙක්ටයාරයකට යෙදිය යුතු යූරියා කි.ග්‍රෑ.100 ය මතුපිට පොහොර යොදන අවස්ථාවන්හිදී යොදන්න.
3. නිර්දේශිත ට්‍රිපල් සුපර් පොස්පේට් හා මියුරියේට් ඔෆ් පොටෑෂ් ප්‍රමාණ වල වෙනසක් නොකර යොදන්න.

මේ අනුව කටයුතු කිරීමෙන් වී වගාව සඳහා නිර්දේශිත පෝෂක ප්‍රමාණවල අඩුවීමක් නොවන අතර, කොළ පොහොර යෙදීම නිසා සැලකිය යුතු වැඩි අස්වැන්නක් ලබාගත හැකි බව පෙන්නුම් කර තිබේ.

## සෙස්බේනියා රොස්ට්‍රාටා රනිල බෝගය වගා කරන ආකාරය හා පසට මිශ්‍ර කළ යුතු ආකාරය:

- වී අස්වනු නෙළීමෙන් පසු හොඳින් කැට පොඩිවනසේ සී සා ගන්න.
- හෙක්ටයාරයකට අවශ්‍ය කරන සෙස්බේනියා රොස්ට්‍රාටා බීජ ප්‍රමාණය වන කි.ග්‍රෑ. 25-30 අතර ප්‍රමාණයක් ගෙන පිරිසිදු භාජනයකට දමා හොඳින් උතුරණ වතුර ඒ මත වත්කර විනාඩි 10 ක පමණ කාලයක් තබා උණු වතුර පෙරා එම අවස්ථාවේදීම සිසිල් ජලය වත්කර පැය 10-12 ත් අතර කාලයක් එම ජලයේම පෙගෙන්නට හරින්න. ඉන් පසු වතුර බේරා හැර මද පවනේ සුළු වේලාවක් ගෝනි මත තුනී කර තබා වැපිරීම සඳහා භාවිතා කරන්න.
- මෙම ප්‍රතිකාරය කරන ලද බීජ වල ප්‍රරෝහන ප්‍රතිශතය යහපත්වන අතර, සාමාන්‍ය තෙතමනය සහිත කලින් සී සාගත් කුඹුරට ඉසීමෙන් පසු යන්තමින්, පසට කලවම් කරන්න. වර්ෂාව දිනපතා පවතිනම් එසේ කලවම් කිරීම අවශ්‍ය නොවේ වර්ෂාව නිසා බීජ පසට අල්ලා ගනී.
- දින 4-5 කින් පසු බීජ ප්‍රරෝහනය වේ. පැළ වැඩීමත් සමග කුඹුරේ ජලය එම පැළ යට නොවන මට්ටමට බඳින්න. මෙම පැළෑටිය ජලය බැඳ තබන තත්වය යටතේ හොඳ වර්ධනයක් පෙන්වන නිසා ජලය බැඳ තැබීම හිතකර වේ.
- බීජ ප්‍රරෝහනය වී දින 45 කදී පැළෑටි වල මල් පිපීම ආරම්භ වන අතර, කඳේ පහළ කොටසේ නයිට්‍රජන් තිර කරනු ලබන බැක්ටීරියා නිසා මනා ගැටිති වර්ධනයක් පෙන්නුම් කෙරේ. යම් ප්‍රදේශයක දිගු කාලීනව මෙම පැළෑටිය වගා කිරීමෙන් අවට වාතයේ සහ පසේ වායුගෝලීය නයිට්‍රජන් තිර කරනු ලබන බැක්ටීරියා ගහනය වර්ධනය වීම හා පැතිරීම නිසා පසුවට හොඳ ගැටිති වර්ධනයක් පෙන්නුම් කෙරේ.
- මල් පිපීම ආරම්භ වන අවස්ථාවේ දී මෙම පැළෑටි පසට යට කළ යුතුය. ඒවායේ කඳ ඉතා සියුම් බැවින් ගවයින් විසින් අදිනු ලබන යකඩ නගුල්, රෝද දෙකේ ට්‍රැක්ටර් (රොටරි නගුල) හෝ රෝද හතරේ ට්‍රැක්ටර් වලට සම්බන්ධ කරන කොකු නගුල් ආදී ඕනෑම උපකරණයකින් හොඳින් පසට යට කළ හැකිය.

- යට කර වතුර බැඳීමෙන් පසු දින 5-7 ක් අතර කාලයක් තුළදී මෙම ශාක කොටස් සාමාන්‍ය වශයෙන් දිරාපත්වන අතර. එම කාලසීමාවෙන් පසුව කුඹුර පෝරු ගෑමෙන් හෝ රොටවේටර් කිරීමෙන් පසු ගොයම් පැළ සිටුවීමට හෝ වැපිරීමට හැකිය.
- ඉන් පසු කලින් සඳහන් කළ ආකාරයට පොහොර යෙදීමෙන් සාමාන්‍ය ක්‍රමයට වගාව රැක බලා ගත හැකිය.

මෙම ක්‍රමයේ දී අමතරව සී සෑමක් අවශ්‍ය නොවන අතර සෙස්බේනියා බීජ ඉසීමට පෙර කරන ලද සී සෑම බිම් නැගුම වශයෙන් සලකා දෙවන සී සෑම වශයෙන් දිය සියඹලා පසට යට කළ හැකිය.

### වර්තමාන රසායනික පොහොර මිල අනුව මෙම ක්‍රමයෙන් ලැබෙන ආර්ථික වාසි:

(අ) අඩුකරන යූරියා පොහොර ප්‍රමාණය හෙක්ටයාරයකට කි.ග්‍රෑ. 100 ක් වේ.

වර්තමාන මිල අනුව ඉතිරි වන මුදල

හෙක්ටයාරයකට රු. 1,200.00

(ආ) නිර්දේශිත යූරියා ප්‍රමාණයෙන් අඩක් සමග සෙස්බේනියා රොස්ට්‍රාටා කොළ පොහොර පසට යට කිරීමෙන් ලැබෙන ආර්ථික වාසිය:

මෙම මිශ්‍රණය යෙදීමෙන් වැඩිවන අස්වනු ප්‍රමාණය හෙක්ටයාරයකට කි.ග්‍රෑ. 400 ක් පමණවේ.

වී කිලෝග්‍රෑම් එකක් රු. 10.00 බැගින් කිලෝ 400 ක වටිනාකම - රු. 4,000.00

(අ) සහ (ආ) එකතුව - රු. 5,200.00

මීට අමතරව මෙම ක්‍රමය දිගු කාලීනව අනුගමනය කිරීමෙන් පසේ බෝග නිෂ්පාදන හැකියාව ක්‍රමයෙන් දියුණුවන බැවින් හෙක්ටයාරයකින් ලබාගත හැකි අස්වනු ප්‍රමාණය ද ක්‍රමයෙන් වැඩි වනු ඇත. බෝකර ගැනීම සඳහා මෙම විශේෂ දිය සියඹලා වර්ගයේ බීජ අවශ්‍ය අය වේ නම් කරුණාකර මා අමතන්න.

---

## පුෂ්ප අංකුරය මැඩීමෙන් කෙසෙල් පැළ බෝ කර ගත හැකි වේ

කෙසෙල් ගසකට මාස 7 - 7 1/2 පමණ ගත වී 28 වන හෝ 29 වන පත්‍රය දිග හැරෙන අවස්ථාව වන විට කඳ තුළ මුහ ඉදීම ආරම්භ වේ. එම අවස්ථාවේ පසුවන නිරෝගී ගසක් තෝරා සිහින් දිගැති පිහියක් හෝ අවගාරයක් ගෙන පොළොව මට්ටමින් චිත්‍රයේ දක්වා ඇති ආකාරයට කඳ මැදට යවා ළපටි පුෂ්ප අංකුරය විනාශ කරන්න. මෙසේ දෙසතියකට වරක් බැගින් නැවත දෙවරක් මෙය කරන්න. ශාකයට නිර්දේශිත පොහොර ප්‍රමාණය යොදන්න. තෙතමනය ආරක්ෂා කරන්න. මාස 4-5 ක් ගත වූ පසු කඳ වටා මොරෙයියන් 16-18 පමණ මතු වේ. මෙයින් ලැබෙන මොරෙයියන් වැඩි ප්‍රමාණයක් කඩු පත් හෝ කන්‍යා මොරෙයියන් වේ. ඒවා මීටරයක් උස් වූ පසු ගලවා සෙත්‍රයේ සිටුවිය හැකිය. මොරෙයියන් ගලවා ගත් පසු නැවත එම පඳුරේම නිරෝගී පැළයක් තෝරා මෙම ක්‍රමය අනුගමනය කොට මොරෙයියන් බෝ කර ගත හැකි වේ. එක පඳුරකින් මෙලෙස තෙවතාවක් පමණ පැළ ලබා ගැනීම සුදුසු ය. කෙසෙල් තවානක දී වුව ද මෙම ක්‍රමය අනුගමනය කළ හැකි වේ.




කෘ.දෙ. උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ
කෘෂිකර්ම පරීක්ෂණ නිලධාරී එම්. ඩයිනීසියස් විසිනි.